ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

1603

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | ගෘහ ආර්ථික විද්‍යාව - I | කාලය: පැය 01 යි. |
|---|---|---|

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ශරීරය තුළ යකඩ අවශෝෂණය පහසු කරන සංයෝග දෙකක් වනුයේ,
(1) ටැනින් සහ මැලික් අම්ලය
(2) මැලික් අම්ලය සහ ලයිසීන්ය
(3) ටැනින් සහ ලයිසීන්ය
(4) ෆයිටික් අම්ලය හා මැලික් අම්ලය

02. ආහාර ද්‍රව්‍යයක පෝෂණ අගය පිළිබඳ ප්‍රකාශ කිපයක් පහත දැක්වේ.
- තන්තු බහුලය
- යකඩ අඩංගුය
- විටමින් C වල ප්‍රභවයකි.

මෙම ආහාර ද්‍රව්‍ය වන්නේ,
(1) ගොටුකොළ (2) කැරට් (3) බතල (4) පේර

03. පොල්වල බහුලව අඩංගු වන්නේ,
(1) ඔමේගා 3 මේද අම්ල
(2) අසංතෘප්ත මේද අම්ල
(3) සංතෘප්ත මේද අම්ල
(4) ට්‍රාන්ස් මේද අම්ල

04. ආහාරයක ප්‍රෝටීන් ග්‍රෑම් 30 ක් අඩංගු වේ නම් එමගින් ලැබෙන ශක්ති ප්‍රමාණය වනුයේ කිලෝ කැලරි,
(1) 120 කි. (2) 180 කි. (3) 210 කි. (4) 150 කි.

05. විටමින් B කාණ්ඩයට අයත් සයනොකෝබැලමින් අඩංගු ආහාර වන්නේ,
(1) කඩල, මුංඇට, සෝයා, පරිප්පු
(2) කිරි, බිත්තර, කුකුළ් මස්, ඉස්සන්
(3) බිත්තර, කුකුළ් මස්, මුංඇට, පරිප්පු
(4) මුංඇට, ඉස්සන්, කිරි, කඩල

06. සිරුරෙහි ජලතුලනය හා අම්ල භෂ්ම තුලනය පාලනය කිරීම සඳහා ක්‍රියා කරන ඛණිජ දෙකකි.
(1) පොටෑසියම් හා මැග්නීසියම්
(2) කැල්සියම් හා මැග්නීසියම්
(3) කැල්සියම් හා සෝඩියම්
(4) පොටෑසියම් හා සෝඩියම්

07. A නැමති ආහාරයේ ප්‍රෝටීන්, කාබෝහයිඩ්‍රේට්, යකඩ, විටමින් A හා විටමින් D අඩංගුය. A විය හැක්කේ,
(1) බිත්තර (2) කිරිය (3) මාළුය (4) බින්තරය

08. මේදය ජීර්ණය කරන එන්සයිමය කුමක් ද?
(1) ලැක්ටේස් (2) පෙප්ටිඩේස් (3) ලයිපේස් (4) සුක්රේස්

09. ආහාර පිරමීඩයේ ඉහළින් ම අඩංගු ආහාර ද්‍රව්‍ය වන්නේ,
(1) සීනි හා මස් (2) මස් හා කිරි (3) තෙල් හා සීනි (4) කිරි හා තෙල්

10. ආහාර ශීතකරණයක් තුළ තැන්පත් කිරීමේ දී $4\,^0C$ - $8\,^0C$ අතර ගබඩා කිරීමට සුදුසු වන්නේ,
(1) මස් ය. (2) එළවළු ය. (3) මාළු ය. (4) පළතුරු ය.



Scanned with CamScanner

11. පහත දැක්වෙන පිසීමේ ක්‍රම අතුරෙන් අඩුම උෂ්ණත්වයක් භාවිතා වනුයේ,
   (1) තැම්බීමේ දී
   (2) නොගැඹුරු තෙලේ බැදීමේ දී
   (3) ස්ටූ කිරීමේ දී
   (4) වාෂ්පයෙන් තැම්බීමේ දී

12. පෙප්සින්, ට්‍රිප්සින්, රෙනින්, එන්සයිම මගින් ජීර්ණය කරනුයේ,
   (1) මේදය ය.
   (2) කාබෝහයිඩ්‍රේට ය.
   (3) විටමින් ය.
   (4) ප්‍රෝටීන් ය.

13. ආහාර පරිරක්ෂණයේ දී සීනි එක් කිරීම මගින් කුමක් සිදුවේ ද?
   (1) සාන්ද්‍රණය අඩු වේ.
   (2) විජලනයට උපකාරි වේ.
   (3) සාන්ද්‍රණය වැඩි වේ.
   (4) ක්ෂුද්‍ර ජීවීන් විනාශ වේ.

14. පරිරක්ෂිත ආහාරයක් ලෙස ලුණුදෙහි දැමීමේ දී සිදුවන ක්‍රියාවලිය වනුයේ,
   (1) බාහිර ආශ්‍රැතිය මගින් ක්ෂුද්‍ර ජීවී වර්ධනයට අහිතකර තත්ත්වයක් ඇති කිරීම.
   (2) දෙහිවල ඇති එන්සයිම අක්‍රිය වීම.
   (3) ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය.
   (4) මාධ්‍යයේ සාන්ද්‍රණය වැඩි වීම.

15. සන්නයනය සහ සංවහනය යන තාප සංක්‍රමණ ක්‍රම භාවිතයෙන් පිසීම සිදුවන ආහාර වර්ග 2 ක් වනුයේ,
   (1) කැඳ හා පැටිස්
   (2) කොළ මැල්លුම් හා ඉදිආප්ප
   (3) ලැවරියා හා පිට්ටු
   (4) තෝසේ හා කිරිබත්

16. අපරදිග විධිමත් ක්‍රමයට ආහාර පිළිගැන්වීමේ දී,
   (1) වතුර වීදුරුව පිඟානට වම් පසින් තැබීම.
   (2) පිඟානට වම් පසින් පලතුරු හැන්ද හා ගෑරුප්පුව තැබීම.
   (3) පිඟානට වම් පසින් ගෑරුප්පුව ද දකුණු පසින් පිහිය හා හැන්ද තැබීම.
   (4) පිඟානට ඉදිරියෙන් අත්පිස්නාව හා අතසෝදන කෝප්පය තැබීම.

17. ගුණාත්මක බවින් යුතු ආහාර තෝරා ගැනීමට ඇති දුෂ්කරතාවයක් වනුයේ,
   (1) ප්‍රමිතියෙන් යුතු ආහාර වෙළඳ පොළේ බහුල වීම.
   (2) ආහාර මනා ලෙස අසුරා තිබීම.
   (3) ආහාර ද්‍රව්‍ය තෝරා ගැනීම පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් වීම.
   (4) වෙළඳපොළේ ඇති ආහාර බොහෝ විට ප්‍රමිතියකින් තොරවීම.

18. ශ්‍රී ලංකාවේ බහුලව පවත්නා පෝෂණ ගැටළුවක් වනුයේ,
   (1) සින්ක් ඌනතාවයි.
   (2) කැල්සියම් ඌනතාවයි.
   (3) යකඩ ඌනතාවයි.
   (4) විටමින් C ඌනතාවයි.

19. ආර්තවහරණයෙන් පසුව ඇතිවන හෝමෝන අසමතුලිතතාවයට හේතු විය හැකි ඌණතා රෝග තත්ත්වයක් වන්නේ,
   (1) විටමින් A ඌනතාවයි.
   (2) කැල්සියම් ඌනතාවයි.
   (3) යකඩ ඌනතාවයි.
   (4) අයඩින් ඌනතාවයි.

20. යොවුන් වියෙහි චිත්තවේග ප්‍රකාශනයෙහි ස්වභාවය වනුයේ,
   (1) තීව්‍ර බව හා ස්ථිර බව ය.
   (2) කෙටිකාලීන හා ප්‍රබල බව ය.
   (3) ක්ෂණික බව හා තීව්‍ර බව ය.
   (4) ස්ථිර බව හා ක්ෂණික බව ය.



Scanned with CamScanner

21. යොවුන් අවධියේ සංවර්ධනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
   (1) සීඝ්‍ර භාවික වර්ධනයක් පෙන්නුම් කරයි.
   (2) අවුරුදු දහයේ දී ගැහැණු හා පිරිමි දරුවන්ගේ උස හා බර සමාන ය.
   (3) ලිංගික පරිණතිය නිසා වෙනස් වන පරිසරයට පහසුවෙන් අනුගත විය හැකිය.
   (4) මතකය, සංජානනය වැනි මානසික හැකිය වර්ධනය වේ.

22. නව යොවුන් වියේ ඇතිවන පොදු ද්විතියික ලිංගික ලක්ෂණයක් වන්නේ,
   (1) කටහඬ මිහිරි වීම ය.
   (2) මස්පිඩු වැඩීම ය.
   (3) උස හා බර වැඩි වීම ය.
   (4) උරහිස් පළල් වීම ය.

23. මාතෘ සායනයක දී එක් වරක් පමණක් සිදු කරන පරීක්ෂණයක් හෝ පරීක්ෂාවකි.
   (1) උස මැනීම
   (2) බර මැනීම
   (3) මුත්‍රා පරීක්ෂණය
   (4) රුධිර පීඩනය මැනීම.

24. යොවුන් දරුවන්ගේ භාවික පිළිබඳ නිවැරදි වනුයේ මින් කුමක් ද?
   (1) ප්‍රියජනක හැඟීම්වලට වඩා අප්‍රියජනක හැඟීම් පිළිබිඹු කිරීම ය.
   (2) නිතර නිතර ක්ෂණික ප්‍රතිචාර දැක්වීම ය.
   (3) කෝපාවේගය සම්පූර්ණයෙන් ම නොපෙන්වීම ය.
   (4) භාවික තේරුම් ගැනීමේ හැකියාව වැඩි බව ය.

25. මව්කිරි නිපදවීම උත්තේජනය කරනු ලබන හෝමෝනය වනුයේ,
   (1) ඉන්සියුලින් ය.
   (2) තෛරොක්සින් ය.
   (3) ප්‍රෝලැක්ටින් ය.
   (4) ඊස්ට්‍රජන් ය.

26. ශ්‍රී ලාංකික දරුවකුගේ සාමාන්‍ය උපත් බර ඇතුළත් වරණය මින් තෝරන්න.
   (1) කිලෝග්‍රෑම් 1.8 – 2.8
   (2) කිලෝග්‍රෑම් 2.0 – 3.0
   (3) කිලෝග්‍රෑම් 2.2 – 3.2
   (4) කිලෝග්‍රෑම් 2.5 – 3.5

27. සංසේචිත ඩිම්බයක් අධිරෝපණය වනුයේ,
   (1) ගර්භාෂ ග්‍රීවය තුළ ය.
   (2) ගර්භාෂය තුළ ය.
   (3) ඩිම්බකෝෂය තුළ ය.
   (4) පැලෝපීය නාලය තුළ ය.

28. ළදරුවෙකුට මාස හතර සම්පූර්ණ වීමේ දී දෙනු ලබන එන්නත වනුයේ,
   (1) BCG එන්නත ය.
   (2) MMR එන්නත ය.
   (3) පංච සංයුජ එන්නත ය.
   (4) ජැපනීස් එන්. සෆලයිටිස් (HE) එන්නත ය.

29. ඇඳුම් නිර්මාණයේ දී භාවිතා වන දෑ අතුරෙන් ද්‍රව්‍ය ලෙස හඳුන්වනුයේ,
   (1) දිදාලය, අඩිකෝදුව සහ ඉස්ත්‍රික්කය ය.
   (2) කතුර, එම්බ්‍රොයිඩර් රාමුව සහ දිදාලය ය.
   (3) පොලිතින්, නූල් කැරලි සහ දුඹුරු කඩදාසි ය.
   (4) මිනුම් පටිය, පොලිතින් සහ ගම් ය.

30. ළදරු ඇඳුමක තිබිය යුතු ලක්ෂණයක් නොවන්නේ,
   (1) සරල බව
   (2) විවර රහිත බව
   (3) මූට්ටු අඩු බව
   (4) කුඩා මෝස්තරයක් සහිත බව



Scanned with CamScanner

31. ළදරු ඇඳුම් මැසීම හා සම්බන්ධ ප්‍රකාශ කිපයක් පහත දක්වා ඇත. මින් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) උරහිස මැසීමේ දී ප්‍රංශ මූට්ටුව යෙදිය හැකිය.

(2) වාටිය මැසීමේ දී සිහින්ව නවා වාටි මැස්ම යොදයි.

(3) අලංකාර කිරීම සඳහා බුලියන් මැස්ම යොදාගත හැකිය.

(4) අත්කට මැසීමේ දී අත්කට වටා වාටි මැස්ම යොදා කිහිල්ලට බලැන්කට් මැස්ම යොදයි.

32. විවිධ මැහුම් ක්‍රම හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සන්නාලි මැස්මෙහි ගමන් ගන්නා නූල නොපිටින් දිස් නොවේ.

(2) හුරුළුකටු මැස්ම, සේයාවැඩ, සඳහා භාවිතා වේ.

(3) සිහින් නූල් දුවවීම තාවකාලික මැහුම් ක්‍රමයක් ලෙස හැඳින්වේ.

(4) පිස්මේන්තු මැස්ම අද්දර නිම කිරීම සඳහා සුදුසු වේ.

33. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කපු රෙදි ගිනිදැල්ලට ඇල්ලූ විට උණු වේ.

(2) අත් සැරසිලි යෙදීමෙන් ඇඳුම්වල මතුපිට අලංකාර කළ හැක.

(3) ළමා ගවුම ලිහිල්ව මැසිය යුතු වේ.

(4) ඇඳුම් එළලීමේ දී හුරුළුකටු මැස්ම යොදා ගත හැක.

34. නෙන්සුක්, මල්රෙදි, වොයිල් යන රෙදි අයත් වනුයේ,

(1) නයිලෝන් වලට ය.
(2) කපු වලට ය.
(3) සේද වලට ය.
(4) ලිනන් වලට ය.

35. රවුම් හැඩැති අත්පිස්නා රදවනයේ වටේ දාරය මසා නිම කිරීමට වඩාත් සුදුසු වන්නේ,

(1) වාටි මැසීමය.
(2) පෝරු යෙදීමය.
(3) පයිපිං යෙදීමය.
(4) බඳනා යෙදීමය.

36. ගෘහිය අය වැය ලේඛනයක අතිරේක වියදම් යටතට අයත් නොවනුයේ,

(1) රෝගාබාධ සඳහා වියදම් ය.
(2) ඇඳුම් පැළඳුම් සඳහා වියදම් ය.
(3) විනෝද කටයුතු සඳහා වියදම් ය.
(4) උත්සව සඳහා වියදම් ය.

37. නිවසක ජනෙල් සඳහා පාරභාෂක විදුරු යෙදීම වඩාත් සුදුසු වන්නේ,

(1) මුළුතැන්ගෙය සඳහා
(2) විසිත්ත කාමරය සඳහා
(3) නිදන කාමරය සඳහා
(4) කෑම කාමරය සඳහා

38. උදාසීන වර්ණ දෙකක් වනුයේ,

(1) කොළ හා දුඹුරු ය.
(2) නිල් හා දම් ය.
(3) කළු හා සුදු ය.
(4) කහ හා අළු ය.

39. බද්ධ වර්ණ ගැළපුමක නිල් හා නිල් දම් වලට අමතරව ඇතුළත් වන අනෙක් වර්ණය මින් කුමක් ද?

(1) දම්
(2) රතු
(3) කහ කොළ
(4) කහ තැඹිලි

40. ගෘහ අභ්‍යන්තර අලංකරණයේ දී සිරස් රේඛා යොදා ගැනීම තුළින්,

(1) ඍජු බවක් හා උස් බවක් හඟවයි.

(2) කලබලකාරී බවක් හා නොසන්සුන් බවක් හඟවයි.

(3) සුන්දර බවක් හා සිත්කළු බවක් හඟවයි.

(4) ශාන්ත බවක් හා තැන්පත් බවක් හඟවයි.



Scanned with CamScanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ஊவா மாகாண கல்வித் திணைக்களம்

Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

1602

| 11 ශ්‍රේණිය | ගෘහ ආර්ථික විද්‍යාව - II | කාලය: පැය 02 යි. |
|---|---|---|

සැලකිය යුතුයි :

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1). සඳමාලිගේ මව පෞද්ගලික අංශයේ සේවයේ යෙදෙන අතර පියා රජයේ සේවකයෙකි. සඳමාලි ඉගෙනුම ලබන්නේ 11 වන ශ්‍රේණියේ ය. ඇයට අවුරුදු 3 ක් වයසැති සහෝදරියක් සිටියි. සඳමාලිගේ මිත්තණිය ද ඔවුන් සමඟ ජීවත් වෙති. ඇය බොහෝ විට සඳමාලිගේ මවගේ ගෘහ කටයුතුවලට දායක වේ.

(i) මෙම පවුල අයත් වන පවුල් වර්ගය හැඳින්විය හැකි නම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මෙම පවුල තුළ දැකිය හැකි යහපත් ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) මෙම පවුල පසුවෙන විශේෂ පෝෂණ අවශ්‍යතා ඇති අවධි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) අතිරේක පන්තියකට සහභාගිවන සඳමාලි හට රැගෙන යාමට සුදුසු දිවා ආහාර වේලකට බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 02)

(v) ගෙවත්තෙන් ලබා ගන්නා කොළ වර්ගයකින් සෑදිය හැකි උදෑසනට සුදුසු පෝෂණීය පානයක් නම් කර එය සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය සඳහන් කරන්න. (ලකුණු 02)

(vi) අවුරුදු 3 ක් වයසැති දරුවා සඳහා ආහාර වේල් සැලසුම් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(vii) සඳමාලි හට නිවස අලංකාරය සඳහා නිර්මාණය කළ හැකි උපාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(viii) උපාංගයට මෘදු ස්වභාවයක් ලබා දිය හැකි ශිල්පීය ක්‍රමය නම් කර, එම ස්වභාවය ලබා දීමට භාවිත කරන මූලික මැහුම් ක්‍රමයක් නම් කරන්න. (ලකුණු 02)

(ix) පවුලේ සාරධර්ම වැඩි දියුණු කරලීම සඳහා මිත්තණියගෙන් ලබාගත හැකි සහයෝගයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(x) මුළුතැන්ගෙයි කාලය, ශ්‍රමය, පිරිමසා ගැනීමට භාවිතා කළ හැකි උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

(2). (i) මුල් ළමා වියේ ගැහැණු දරුවකු සඳහා ඇඳුමක් නිර්මාණය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ළමා ගවුම මැසීමේ අනුපිළිවෙළ දක්වන්න. (ලකුණු 03)

(iii) සාක්කු දෙකක් සහිත ලිපි රඳවනයකට පතරොම නිර්මාණය කරන්න. (ලකුණු 04)

(3). (i) ප්‍රෝටීන්වලින් ශරීරයට ඉටුවන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත දැක්වෙන ආහාර වර්ග පිසින ක්‍රමය නම් කරන්න. ඉන් එක් ක්‍රමයක් පැහැදිලි කරන්න.

(1) ඉඳි ආප්ප (2) පුඩිං (3) සුප්

(ලකුණු 03)

(iii) ගෘහස්ථ ශීතකරණයක් තුළ ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)



Scanned with CamScanner

(4). (i) ආහාර පිසීමේ ක්‍රම යටතේ තෙත් තාපයෙන් පිසීම වර්ග කර දක්වන්න. (ලකුණු 03)

(ii) පෙරදිග සංස්කෘතියට අනුව එක් අයකුට ආහාර මේසය සකස් කිරීමේ දී උපකරණ තබන ආකාරය රූප සටහනකින් දක්වන්න. (ලකුණු 03)

(iii) ආහාර පරිරක්ෂණයේ දී යොදා ගන්නා උපක්‍රම හතරක් නම් කර, ඒ සඳහා උපයෝගී කර ගන්නා ක්‍රම නම් කරන්න. (ලකුණු 04)

(5). (i) තම නිවස පිහිටි පරිසරය ප්‍රසන්න වීම සඳහා ගෙවත්ත අලංකරණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ගෘහීය සම්පත් වර්ග කර දක්වන්න. (ලකුණු 03)

(iii) ඒක වර්ණ ගැළපුම මඟින් නිදන කාමරයක් අලංකාර කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(6). (i) සායනයක දී ගර්භණී මවක් රුධිර පරීක්ෂණයට භාජනය කිරීම මඟින් හඳුනාගත හැකි කරුණු තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) ළදරුවකු රැක බලා ගැනීමේ දී, ඔහුගේ භාෂා වර්ධනයට අවස්ථාව සලසා දීම සඳහා මවගේ කාර්ය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) යොවුන්වියේ දරුවන් හා වැඩිහිටියන් අතර ගැටළුකාරී තත්ත්වයන් ඇති කිරීමට හේතුවන කරුණු හතරක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(7). (i) යොවුන්වියේ දරුවෙකු තුළ සමාජීය සංවර්ධනයේ දී දැකිය හැකි ලක්ෂණ හයක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) මුල් ළමා විය සංවර්ධනයේ දී කායික වර්ධනයේ දැකිය හැකි ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 03)

(iii) මව්කිරි ළදරුවෙකුට ලබා දීමෙන් මවට සැලසෙන වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

**********



Scanned with CamScanner

උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

| 11 ශ්‍රේණිය | ගෘහ ආර්ථික විද්‍යාව | |
|---|---|---|

පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 2 | 11. 3 | 21. 4 | 31. 1 |
| 02. 1 | 12. 4 | 22. 3 | 32. 2 |
| 03. 3 | 13. 3 | 23. 1 | 33. 3 |
| 04. 4 | 14. 1 | 24. 4 | 34. 3 |
| 05. 2 | 15. 4 | 25. 3 | 35. 4 |
| 06. 4 | 16. 3 | 26. 4 | 36. 2 |
| 07. 3 | 17. 4 | 27. 2 | 37. 3 |
| 08. 3 | 18. 3 | 28. 3 | 38. 2 |
| 09. 3 | 19. 2 | 29. 3 | 39. 1 |
| 10. 2 | 20. 3 | 30. 2 | 40. 2 |


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න